# ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අධ්‍යයන කාර්යයේදී මුහුණපාන බාධක සහ දුෂ්කරතා : පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ උපාධි අපේක්ෂකයන් ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

UNIVERSITY OF PERADENIYA
5 DEC 1980
EXAMINATIONS BRANCH

සිල්වි සේනාධීර
බී.ඒ. (ලංකා) අධ්‍යාපන ඩිප්ලෝමා (ලංකා)

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කරන පර්යේෂණාත්මක නිබන්ධනයකි

ඔක්තෝබර් - 1980

347399

## පර්යේෂණ සාරාංශය

මෙය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ 1979/1980 අධ්‍යයන වර්ෂයේ සිංහල මාධ්‍යයෙන් ඉගෙනීම ලැබූ උපාධි අපේක්ෂක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නියැදියක් (සංඛ්‍යාව 500) ඇසුරින් ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අධ්‍යයන කාර්යයේදී මුහුණපාන බාධක සහ දුෂ්කරතා පිළිබඳව කරන ලද සමාජ විද්‍යාත්මක අධ්‍යයනයකි.

අධ්‍යයනය පිළිබඳ හැඳින්වීමක්ද විශ්ව විද්‍යාල සංකල්පය, විශ්ව විද්‍යාලවල පරමාර්ථ සහ අරමුණු, විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය, ශිෂ්‍යයන් මුහුණපාන බාධක සහ දුෂ්කරතා අර්ථ කථනය, දුෂ්කරතා සහ බාධක ක්ෂෙත්‍ර, ආදී මාතෘකාවට සම්බන්ධ සංකල්ප පැහැදිලි කිරීම අධ්‍යයනය ආරම්භයේදී සිදු කෙරුණි. ඉන්පසු තරුණ ශිෂ්‍යයන්ගේ පොදු අවශ්‍යතා සහ ගැටළු, පිටරටවල විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මුහුණපාන ගැටළු සහ ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මුහුණපාන ගැටළු මෙම අධ්‍යයනයේ පසුබිම ආශ්‍රිත කරුණු වශයෙන් විග්‍රහ කරන ලදී.

පේරාදෙණිය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මුහුණපාන අධ්‍යයන බාධක සහ දුෂ්කරතා අනාවරණය කර ගැනීම සඳහා අනුගමනය කල පිරි සැළැස්මද, ඒ මගින් රැස්කරගත් දත්ත විශ්ලේෂණය සහ ප්‍රතිඵලද, මෙම අධ්‍යයනය ආශ්‍රයෙන් කෙරෙන සාකච්ඡා, නිගමන සහ යෝජනාද අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලදී.

1979 ඔක්තෝබර් 15 වන දින ආරම්භවූ මෙම සමීක්ෂණය 1980 ඔක්තෝබර් දක්වා පියවර කිහිපයකින් පවත්වාගෙන යන ලදී. මෙම සමීක්ෂණයේ දත්ත රැස්කර ගැනීම සඳහා, ප්‍රධාන වශයෙන්ම උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා සකස් කළ ප්‍රශ්නාවලියක් උපයෝගී කරගන්නා ලදී. මෙම ප්‍රශ්නාවලිය සකස් කිරීමේදී, ශිෂ්‍යයන් සමඟ කරන ලද මූලික සම්මුඛ සාකච්ඡා සහ නියාමක ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් එකතු කරගත් දත්ත උපයෝගී කරගන්නා ලදී. මෙම ශිෂ්‍ය ප්‍රශ්නාවලිය කොටස් 2 කින් යුක්ත විය. ඉන් පළමුවන කොටසට ශිෂ්‍යයන්ගේ පසුබිම පිළිබඳ කරුණු දැනගැනීම සඳහා ද, දෙවන කොටසට, දුෂ්කරතා පිළිබඳ කරුණු දැනගැනීම සඳහා සහ එම කරුණු පිළිබඳ ශිෂ්‍ය ආකල්ප විමසීම සඳහාද ප්‍රශ්න ඇතුළත් කරන ලදී.

ශිෂ්‍ය ප්‍රශ්නාවලියට ලැබුන දත්ත විශ්ලේෂණයේදී ප්‍රතිචාරයන් ප්‍රමාණාත්මකව ගණනය කරන ලද අතර, ඒවාට දෙන ලද සංඛ්‍යාමය වටිනාකම් ආශ්‍රයෙන් ශිෂ්‍යයන් මුහුණපෑ බාධක සහ දුෂ්කරතාවල ස්වභාවය හඳුනාගැනීමට හැකිවිය. මෙම දුෂ්කරතා කොතෙක් දුරට ශිෂ්‍යයන්ට පොදු වශයෙන් බලපාන්නේදැයි ඔවුන්ගේ ආකල්ප විමසීමෙන් අවබෝධ කරගත හැකිවිය.

එළිදරව් වුත ශිෂ්‍ය දුෂ්කරතා ඒවාට අදාළ පොදු මාතෘකා යටතේ ගෙන ගණනය කිරීමෙන් ශිෂ්‍යයන්ගේ දුෂ්කරතා විද්‍යාමානවූ පොදු ක්ෂේත්‍රයන් මොනවාදැයි පැහැදිලි කර ගැනීමටද, එම දුෂ්කරතා ක්ෂේත්‍රයන්හි, දුෂ්කරතා ප්‍රමාණයන් සාපේක්ෂ වශයෙන් ගණනය කිරීමටද හැකිවිය.

තීව්‍රභාවය අනුව එළිදරව්වූ දුෂ්කරතා ක්ෂේත්‍රයන් අවරෝහන ක්‍රමයට මෙසේ දැක්විය හැක: ආර්ථික ප්‍රශ්න, විභාග, ඉංග්‍රීසි භාෂාමය දුෂ්කරතා, පුස්තකාල පහසුකම්, පෞද්ගලික ප්‍රශ්න, විෂය මාලාව, සාමාජික ප්‍රශ්න සහ ඉගැන්වීම් ක්‍රමයි. මෙම ක්ෂේත්‍රයන් අතුරින් ශිෂ්‍යයන් අවම අපහසුකම්වලට භාජනයවී ඇත්තේ, ඉගැන්වීම් ක්‍රම සම්බන්ධයෙන්ය.

දුෂ්කරතා ක්ෂේත්‍රයන් අතුරින් සාමාජික සහ ආර්ථික ක්ෂේත්‍ර අතරද, ඉගැන්වීම් ක්‍රම සහ පුස්තකාල අතරද, ඉංග්‍රීසි සහ විෂය මාලාව අතරද, ඉංග්‍රීසි සහ පුස්තකාල අතරද සම්බන්ධයන් පවතින බව හෙළිවිය.

දුෂ්කරතාවයන් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනසක් විද්‍යාමාන වන්නේදැයි පරීක්ෂා කරන ලදුව, දුෂ්කරතා ක්ෂේත්‍රයන්හි තීව්‍රභාවයෙහි අනු පිළිවෙලෙහි ස්ත්‍රී පුරුෂ වශයෙන් දක්නට ලැබුනේ ඉතා සුළු වෙනසක් බව හෙළිවිය.

දත්ත විශ්ලේෂණය මගින් ශිෂ්‍යයන් එළිදරව් කළ පෞද්ගලික කරුණු සහ ශිෂ්‍යයන් මුහුණ පෑ දුෂ්කරතා අතර සම්බන්ධයක් විද්‍යාමාන වන්නේදැයි සොයා ගැනීමටද හැකිවිය. එසේ එළිදරව්වූ කරුණු අතර දෙමව්පියන්ගේ ආදායම සහ ආර්ථික දුෂ්කරතා අතරද, ශිෂ්‍යයන්ගේ ගම් ප්‍රදේශය සහ ආර්ථික කරුණු අතරද සම්බන්ධයක් විද්‍යාමාන විය.

මෙසේ ලැබුන ප්‍රතිඵල ශිෂ්‍යයන් ආශ්‍රයෙන්ම පරීක්ෂාකර බැලීමේ පියවරක් වශයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රශ්නාවලින්ට සහ සම්මුඛ සාකච්ඡාවන්ට දෙන ලද ප්‍රතිචාර ආශ්‍රයෙන් ශිෂ්‍යයන්ගේ ගැටළු පිළිබඳව අනාවරණයවූ කරුණු එම ශිෂ්‍යයන් සමඟ කටයුතු කරන විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලය, විශ්ව විද්‍යාල පුස්තකාල අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ඉංග්‍රීසි අංශයේ උපදේශකවරුන්, ශිෂ්‍ය ශුභසාධන අංශයේ නිලධාරීන් ඇතුළු වගකිව යුත්තන්ගේ අදහස්ද සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලීන් 4 ක් ඇසුරින් තවදුරටත් පරීක්ෂා කරන ලදී. මේ අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් අධ්‍යාපනික බාධක සහ දුෂ්කරතා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අදහස්, ඔවුන් හා ඉතා කිට්ටුවෙන් කටයුතු කරන අයගේ අදහස් සමඟ සසඳා බැලීමටද හැකිවිය.

මෙම ප්‍රශ්නාවලීන්ගෙන් ලැබුණු වැදගත් ප්‍රයෝජනයක් වූයේ ශිෂ්‍යයන් එළිදරව් කල දුෂ්කරතා පුළුල් ලෙස විමර්ශනයට ලක් කිරීමයි. මෙම විමර්ශනයන් ඇසුරින් එකී දුෂ්කරතාවන්ගේ යථා ස්වභාවයද, ඒවා සම්බන්ධයෙන් අනුගමනය කළයුතු

ප්‍රතිකර්මයන් පිළිබඳවද කරුණු අනාවරණය කරගත හැකිවිය. ශිෂ්‍ය ණය ක්‍රමය වෙනුවට ශිෂ්‍යාධාර ක්‍රමයක් ඇතිකිරීම, පුස්තකාල භාවිතයේදී ශිෂ්‍යයන්ට අවශ්‍යවන පහසුකම් සහ දැනුම ලබාදීම , ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි පිළිබඳ දුෂ්කරතා ඇතිවන ආකාරය සහ එම දුෂ්කරතා විශ්ව විද්‍යාලයේදී අඩුකර ගැනීමට ගතහැකි ක්‍රියා මාර්ග, ශාලාවල ශිෂ්‍ය ජීවිතය ප්‍රියජනක කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග, යන කරුණු මෙසේ අනාවරණය කරගන්නා ලද වැදගත් කරුණු අතර වේ.

ශිෂ්‍ය දුෂ්කරතා සම්බන්ධයෙන් පිටරටවල අනුගමනය කෙරෙන ක්‍රියා කලාපයන් අපේ රටේද කොතෙක් දුරට සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිදැයි විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලයට දුන් ප්‍රශ්නාවලින් ආශ්‍රයෙන් විමසීමටද හැකිවිය. අඛණ්ඩ ඇගයීම් ක්‍රමය භාවිතය, පාඨමාලා විවිධ කිරීම, කලා විද්‍යා විෂය පරතරය අඩු කිරීම, ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ශිෂ්‍ය ආකල්ප විමසීම පිළිබඳ ආචාර්යවරුන්ගේ මතය, පුස්තකාලයේ උපාධි අපේක්ෂක අංශයක් පිහිටුවීම, ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර අඩංගු කාමරයක් පුස්තකාලයේ පිහිටුවීම ආදිය මෙම යෝජනා අතර වැදගත් විය.

පරීක්ෂාවට භාජනය කරන ලද දුෂ්කරතාවයන් සම්බන්ධයෙන් ලැබුන ප්‍රතිඵල සාකච්ඡාවේදී ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ ශිෂ්‍යයන්ට තොරතුරු ඉදිරිපත් කිරීම, ලකුණු කළ නිබන්ධන ආපසු ලැබීම යන කරුණු සම්බන්ධයෙන් දුෂ්කරතා හෙළිවූයේ ඉතා මද වශයෙන් බව පෙනේ.

දුෂ්කරතා විද්‍යාමාන නොවූ ක්ෂේත්‍ර අතර, දේශනවල වේගය, දේශනවල පැහැදිලි භාවය, අභ්‍යාස පත්තිවල අදහස් හුවමාරුව, පිළිබඳව ශිෂ්‍යයන්ට ප්‍රශ්න ඇතිවූ බවක් නොපෙණුනි. විශ්ව විද්‍යාල ප්‍රේම සම්බන්ධතා ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතුවලට බාධාවක් නොවූ අතර, එය ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතුවලට මදක් හිතකර වූ බව ශිෂ්‍යයන්ගේ මතය විය. නවක වදයට ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවක් භාජනය වුවත්, එය ඔවුන්ගේ සිතේ අධ්‍යාපනික දුෂ්කරතාවයක් වීමට තරම් මානසික වේදනාවක් ඇති නොකළ බව හෙළිවිය.

මේ හැර පරීක්ෂාවට භාජනය කරන ලද අනික් සෑම කරුණක් සම්බන්ධයෙන්ම ශිෂ්‍යයන්ට දුෂ්කරතා ඇතිවූ බව පෙනේ.

අවසාන වශයෙන් දුෂ්කරතා වැඩි වශයෙන් හෙළිදරව්වූ ක්ෂේත්‍රයන්හි එම දුෂ්කරතා පිටු දැකීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග සාකච්ඡා කරන ලදී. මෙම සාකච්ඡාවේදී මෙම අධ්‍යයනයෙන් හෙළිවූ කරුණුද මෙරට සහ පිටරට, උසස් අධ්‍යාපන නවීකරණය පිළිබඳ කර ඇති අධ්‍යයනයන්ද උපයෝගී කරගන්නා ලදී.